කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

බාහිර විභාග අංශය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2010

2012 ජනවාරි / පෙබරවාරි

සමාජීය විද්‍යා පීඨය

ආර්ථික විද්‍යාව - ECON- E 2015

සූක්ෂ්ම ආර්ථික විද්‍යාව

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 07 යි. කාලය : පැය 03 යි.

ප්‍රස්ථාර කොල සපයනු ලැබේ.

---

01. උපේක්ෂා වක්‍ර භාවිතා කර මිල අඩුවීමක ආදේශන සහ ආදායම ප්‍රතිවිපාක හික්සියන් (Hickshian) සහ ස්ලට්ස්කි (Slutsky) යන ක්‍රම මගින් වෙන්කර දක්වන්න. මාර්ෂලියන් (Marshalian) සහ හික්සියන් ඉල්ලුම වක්‍ර දෙක රූප සටහන් මගින් පෙන්වන්න.

02. බාහිරතා හඳුන්වා විවිධ බාහිරතා වර්ග උදාහරණ මගින් දක්වා බාහිරතා අභ්‍යන්තරීකරණය කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

03. පහත සඳහන් සංකල්ප ප්‍රස්තාර මගින් පැහැදිලි කරන්න.

අ) ඒකාධිකාරී මිල විශ්ලේෂණය

ආ) මිල පරිභෝජන වක්‍රය

ඇ) ආදායම් පරිභෝජන වක්‍රය

ඈ) ඒන්ජල් වක්‍රය

04. සූක්ෂ්ම ආර්ථික විද්‍යාවේ කාර්ය භාරය වන්නේ සම්පත් ප්‍රශස්ත අයුරින් බෙදාහරින්නේ කෙසේද යන්න නිශ්චය කිරීමයි. මේ අයුරින් සම්පත් ප්‍රශස්ත අයුරින් බෙදා හැරීමේ දී පැන නගින ප්‍රශ්න කවරේද? වර්තමානයේ ශ්‍රී ලංකාවේ සම්පත් ප්‍රශස්ත අයුරින් බෙදී තිබේද? විමසන්න.

05. අ) පූර්ණ තරගයේ සහ ඒකාධිකාරයේ ලක්ෂණ සසඳන්න.

ආ) කෙටිකාලයේදී පූර්ණ තරගකාරී ආයතනයක් අතිප්‍රමාණික ලාභ ලබන අතර ඒකාධිකාරී ආයතනය කෙටිකාලයේදී මෙන්ම දිගු කාලයේදී ද අති ප්‍රමාණික ලාභ ලබයි. විමසන්න.

06. $D(p) = a - bp$ ඉල්ලුම් ශ්‍රිතය සහ $S(p) = -c + dp$ සැපයුම් ශ්‍රිතය වන අතර මෙම ශ්‍රිත භාවිතා කර පහත සඳහන් දෑ ගණනය කරන්න.

අ) සමතුලිත මිල සහ සමතුලිත ප්‍රමාණය

ආ) රජය විසින් t නමැති ප්‍රමාණයක බද්දක් පැනවුව හොත් නව සමතුලිත මිල සහ ප්‍රමාණය සොයන්න. සැපයුම් වක්‍රය විතැන්වීම රූප සටහන් මගින් පෙන්වන්න.

ඇ) රජය විසින් s ප්‍රමාණයක නිෂ්පාදන පිහිටාධාරයක් දුනහොත් නව සමතුලිත මිල සහ ප්‍රමාණය සොයන්න. සැපයුම් වක්‍රය විතැන් වන අයුරු රූප සටහන් මගින් පෙන්වන්න.

ඈ) බදුබර පාරිභෝගිකයා සහ නිෂ්පාදකයා අතර බෙදී යන්නේ කුමන හේතු පදනම් කර ගෙනද? බදුබර අනුව භාණ්ඩ වර්ග කරන්නේ කෙසේද?

07. මකුළුදැල් න්‍යාය හඳුන්වා එහි අපසරන (Divergent) සහ අභිසරන (Convergent) ආකෘති රූප සටහන් මගින් පැහැදිලි කරන්න.

*****************************